54676



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus**

**NEW**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**80 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2017**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය **I, II**
தகவல் தொடர்பாடல் தொழினுட்பவியல் **I, II**
Information & Communication Technology **I, II**

පැය තුනයි
*மூன்று மணித்தியாலம்*
*Three hours*

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** $01011_2$ යන ද්විමය සංඛ්‍යාවට තුල්‍ය දශමය සංඛ්‍යාව කුමක් ද?
(1) 11 (2) 35 (3) 15 (4) 10

**2.** $111110110010_2$ යන ද්විමය සංඛ්‍යාවට තුල්‍ය අෂ්ටක සංඛ්‍යාව කුමක් ද?
(1) $7552_8$ (2) $2667_8$ (3) $2557_8$ (4) $7662_8$


**3.** $11101011000111010_2$ ට තුල්‍ය ෂඩ්දශමය සංඛ්‍යාව වන්නේ,
(1) $DD63A_{16}$ (2) $1D63A_{16}$ (3) $1D33A_{16}$ (4) $1D631_{16}$

**4.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න:
A - $2B_{16}$ යන්න $53_8$ ට තුල්‍ය වේ
B - $43_{10}$ යන්න $101011_2$ ට තුල්‍ය වේ
C - $101011_2$ යන්න $53_8$ ට තුල්‍ය වේ
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B, C සියල්ල ම ය.

**5.** පහත සඳහන් කුමන සන්නිවේදන මාධ්‍යය ආලෝකය පරාවර්තනය කිරීම මගින් දත්ත සම්ප්‍රේෂණය සිදු කරයි ද?
(1) නොවැසුණු ඇඹරූ කම්බි යුගල (UTP) (2) ප්‍රකාශ තන්තු (Optical fiber)
(3) සමාක්ෂ කේබල (Coaxial cables) (4) වැසුණු ඇඹරූ කම්බි යුගල (STP)

**6.** සමහර උපක්‍රම (devices) ආදාන (input) හෝ ප්‍රතිදාන (output) ලෙස පමණක් ක්‍රියා කරන අතර, තවත් සමහරක් ආදාන සහ ප්‍රතිදාන යන දෙයාකාරයටම ක්‍රියා කරයි. පහත සඳහන් ඒ අතුරෙන් කවරක් ප්‍රතිදාන උපක්‍රම ලෙස පමණක් ක්‍රියා කරයි ද?
(1) ස්පර්ශක තිරය (touch screen display) සහ සුපිරික්සකය (scanner)
(2) මුද්‍රණ යන්ත්‍රය සහ වෙබ් කැමරාව
(3) මුද්‍රණ යන්ත්‍රය සහ ස්පීකරය (speaker)
(4) ස්පර්ශක තිරය (touch screen display) සහ තීරු කේත කියවනය (barcode reader)

**7.** දකුණු පසින් දැක්වෙන තර්කන පරිපථයට (logic circuit) තුල්‍ය සත්‍යතා වගුව කුමක් ද?




(1)

| A | B | ප්‍රතිදානය |
|---|---|---|
| 0 | 0 | 1 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 0 |

(2)

| A | B | ප්‍රතිදානය |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 0 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 0 |

(3)

| A | B | ප්‍රතිදානය |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 0 |
| 1 | 1 | 0 |


(4)


| A | B | ප්‍රතිදානය |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 0 |


[දෙවැනි පිටුව බලන්න.


+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK


8. දකුණු පසින් දැක්වෙන තර්කන පරිපථයේ සත්‍යතා වගුව හා තුල්‍ය සත්‍යතා වගුවක් සහිත තර්කන පරිපථය කුමක් ද?




(1)



(2)



(3)



(4)



9. පහත සඳහන් වගන්ති සලකා බලන්න:

A - දෘඪාංග කළමනාකරණය

B - පරිශීලක අතුරු මුහුණත (user interface) ලබා දීම

C - පැතුරුම්පත් හා වදන් සැකසුම් පහසුකම් ලබා දීම

ඉහත සඳහන් ඒවායින් මෙහෙයුම් පද්ධතියක (operating system) මූලික කාර්ය වන්නේ

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ල ම ය.

10. පහත සඳහන් වගන්ති සලකා බලන්න:

A - පරිගණකයක රෙජිස්තර මතක (register memory) ධාරිතාව දෘඪ තැටියක ධාරිතාවට වඩා කුඩා වේ.

B - රෙජිස්තර මතකයේ දත්ත ප්‍රවේශ වේගය (access speed) දෘඪ තැටියේ එම වේගයට වඩා අඩු වේ.

C - රෙජිස්තර මතකයේ දත්ත ආචයනය (store) සඳහා බිටුවකට යන වියදම, දෘඪ තැටියේ දත්ත ආචයනය සඳහා බිටුවකට යන වියදමට වඩා වැඩි වේ.

ඉහත වගන්ති අතුරෙන් සත්‍ය වන්නේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ල ම ය.

11. පහත සඳහන් වගන්ති සලකන්න:

A - සොරකම් කරන ලද වෙනත් අයෙකුගේ පරිශීලක නාමය (user ID) සහ මුරපදයක් (password) භාවිත කර පරිගණකයකට ප්‍රවේශ වීම


B - බලපත්‍ර සඳහා මුදල් ගෙවීමක් නොකර නිදහස් හා විවෘත මූල මෘදුකාංග (free and open source software) බාගැනීම (downloading) හා ස්ථාපනය (installing) කිරීම

C - මාර්ගගත (online) සාප්පුවක කළමනාකරු විසින් පාරිභෝගිකයින්ගේ කැමැත්ත නොමැතිව ඔවුනගේ විද්‍යුත් තැපැල් ලිපින ලැයිස්තුවක් අලෙවිකරණ සමාගමකට විකිණීම

ඉහත සඳහන් කවර නිදසුන් මගින් සදාචාර විරෝධී (ethical issues) ක්‍රියාකාරකම් සිදු වේ ද?

(1) A සහ B මගින් පමණි (2) B සහ C මගින් පමණි (3) A සහ C මගින් පමණි (4) A, B හා C සියල්ල ම මගිනි

12. පහත Ⓟ, Ⓠ, Ⓡ හා Ⓢ ලෙස ලේබල් කර ඇති නිරූපක හතර, ලේඛනයක ඇති පාඨ (text) එකෙල්ල (align) කිරීම සඳහා වදන් සැකසුම් මෘදුකාංගවල සාමාන්‍ය වශයෙන් භාවිත කරනු ලැබේ.




පහත දක්වා ඇති වගන්ති සලකා බලන්න:

A - Ⓟ මගින් පාඨ වමට එකෙල්ල කරන අතර, Ⓡ මගින් පාඨ දකුණට එකෙල්ල කරනු ලබයි.

B - Ⓟ මගින් පාඨ වමට එකෙල්ල කරන අතර, Ⓢ මගින් පාඨ දකුණට පමණක් එකෙල්ල කරනු ලබයි.

C - Ⓠ මගින් පාඨ මැදට එකෙල්ල කරන අතර, Ⓢ මගින් පාඨ වමට හා දකුණට යන දෙපසටම එකෙල්ල (justify) කරනු ලබයි.

ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ල ම ය.

13. දකුණත් භාවිතකරුවකු විසින් ගොනු බහලුමක් (folder) තුළ තිබෙන පැතුරුම්පත් ගොනුවකට සිදු කරන ලද පහත සඳහන් කාර්ය සලකා බලන්න:

A - මූසික දර්ශකය (mouse pointer) ගොනුව මත ස්ථානගත කර මූසිකයේ දකුණු බොත්තම එක් වරක් ක්ලික් කිරීම

B - මූසික දර්ශකය ගොනුව මත ස්ථානගත කර මූසිකයේ දකුණු බොත්තම දෙවරක් ක්ලික් කිරීම

C - මූසික දර්ශකය ගොනුව මත ස්ථානගත කර මූසිකයේ වම් බොත්තම දෙවරක් ක්ලික් කිරීම

ඉහත සඳහන් ඒවායින් පැතුරුම්පත් ගොනුව විවෘත වීම සිදු වන්නේ

(1) A මගින් පමණි. (2) B මගින් පමණි. (3) C මගින් පමණි. (4) A හා C මගින් පමණි.

[තුන්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**14.** වදන් සැකසුම් මෘදුකාංගවල සාමාන්‍යයෙන් භාවිත වන කෙටි මං යතුරු සම්බන්ධව පහත දක්වා ඇති වගන්ති සලකා බලන්න:

A - Ctrl + C යන්න පාඨ/වස්තු කොපි කිරීම (copy) සඳහා භාවිත කරයි.
B - Ctrl + A යන්න ලේඛනයක ඇති සියලු පාඨ/වස්තු තේරීම (select) සඳහා භාවිත කරයි.
C - Ctrl + V යන්න කොපි කරන ලද පාඨ/වස්තු ඇලවීම (paste) සඳහා භාවිත කරයි.

ඉහත කුමන වගන්ති නිවැරදි වේ ද?

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ල ම

**15.** පැතුරුම්පතක කෝෂයකට =2^3+(5-3)*6/4 සූත්‍රය ඇතුළත් කර තිබේ. එම කෝෂයෙහි පෙන්නුම් කරනු ලබන සංඛ්‍යාව කුමක් ද?

(1) 5 (2) 8.5 (3) 11 (4) -1.25

● අංක 16 සහ 17 ප්‍රශ්න සඳහා දී ඇති පැතුරුම්පත් කොටස සහ පහත දක්වා ඇති තොරතුරු පාදක කරන්න.

※ අරය $r$ ලෙස දී ඇති විට වෘත්තයක පරිධිය ගණනය කිරීම සඳහා $2\pi r$ සූත්‍රය භාවිත කරනු ලැබේ.
※ C2 කෝෂයේ දක්වා ඇත්තේ $\pi$ හි අගය බව උපකල්පන කරන්න.

| | A | B | C |
|---|---|---|---|
| 1 | අරය | පරිධිය | π |
| 2 | 20 | 125.6637061 | 3.14159 |
| 3 | 21 | 131.9468915 | |
| 4 | 25 | 157.0796327 | |
| 5 | 22 | 138.2300768 | |
| 6 | | | |

**16.** වෘත්තයේ පරිධිය ගණනය කිරීම සඳහා B2 කෝෂයට ඇතුළත් කළ යුතු සූත්‍රය කුමක් ද?

(1) =2*$C$2*A2 (2) =2*$C2^$A2 (3) =2*C2^A2 (4) =2^C2^A2

**17.** A6 කෝෂයට = SUM(A2:A5)/COUNT(A2:A5) සූත්‍රය ඇතුළත් කළ විට පහත සඳහන් කවරක් A6 කෝෂයේ දිස්වන්නේ ද?

(1) 1 (2) 17.6 (3) 22 (4) 88

**18.** සමර්පන (presentation) මෘදුකාංගයක් භාවිතයෙන් නිපදවන ලද, විවිධ වස්තූන් (objects) ඇතුළත් කදාවක් (slide) සම්බන්ධයෙන් පහත වැකි සලකා බලන්න:

A - කදාවක ඇති විවිධ වස්තූන්ට *සජීවන ආවරණ* (*animation effects*) යෙදිය හැකි ය.
B - *කදා සංක්‍රාන්තිය* (*slide transition*) යොදා ගත හැකි වන්නේ මුළු කදාවටම පමණි.
C - *කදා දැක්ම දසුනේ* (*slide show view*) දී කදාවක සිට ඊළඟ කදාවට මාරු වීමේ දී *කදා සංක්‍රාන්ති ආවරණය* ඇති වේ.

ඉහත කවර වගන්ති නිවැරදි වන්නේ ද?

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ල ම

● අංක 19 සිට 22 තෙක් ප්‍රශ්න සඳහා පහත දී ඇති ශිෂ්‍යයන්ගේ විෂය ලකුණු ආචයන සඳහා භාවිත කර ඇති දත්ත සමුදා වගු පාදක කර ගන්න.

ශිෂ්‍ය වගුව

| DoB | Name | Student_No | Class |
|---|---|---|---|
| 20/11/95 | Sarath | 1001 | 1A |
| 17/12/95 | Kolitha | 1002 | 1A |
| 21/10/95 | Kapila | 1003 | 1A |
| 18/12/95 | Nalin | 1004 | 1B |

විෂය වගුව

| Sub_Code | Subject |
|---|---|
| 01 | Sinhala |
| 02 | Art |
| 03 | English |

ලකුණු වගුව

| Sub_Code | Student_No | Marks |
|---|---|---|
| 01 | 1001 | 85 |
| 02 | 1001 | 80 |
| 01 | 1002 | 65 |
| 03 | 1003 | 70 |

**19.** විෂය වගුවෙහි ක්ෂේත්‍ර (fields) සංඛ්‍යාව කොපමණ ද?

(1) 2 (2) 3 (3) 4 (4) 6

**20.** ශිෂ්‍ය වගුව සඳහා ප්‍රාථමික යතුර (primary key) ලෙස වඩාත්ම යෝග්‍ය ක්ෂේත්‍රය කුමක් ද?

(1) Student_No (2) DoB (3) Name (4) Class

**21.** දත්ත සමුදායෙහි ආගන්තුක යතුර (foreign key) සඳහා නිදසුනක් වන්නේ කවරක් ද?

(1) විෂය වගුවෙහි Sub_Code (2) ලකුණු වගුවෙහි Sub_Code
(3) ලකුණු වගුවෙහි Marks (4) ශිෂ්‍ය වගුවෙහි DoB

**22.** ඉංග්‍රීසි (English) සඳහා කපිල (Kapila) ලබාගත් ලකුණු සංඛ්‍යාව කොපමණ ද?

(1) 65 (2) 70 (3) 80 (4) 85

[හතරවැනි පිටුව බලන්න.

54676


**23.** දත්ත සමුදාය මෘදුකාංගයක් සම්බන්ධයෙන් පහත වගන්ති සලකා බලන්න:

A - එක් වස්තුවකට (object) සම්බන්ධිත ක්ෂේත්‍ර එකතුවකට උපලැකියාවක් (record) යැයි කියනු ලැබේ.
B - සම්බන්ධිත වගු (related tables) එකතුවකට දත්ත සමුදායක් යැයි කියනු ලැබේ.
C - එක් වගුවක ආගන්තුක (foreign) යතුර තවත් වගුවක ප්‍රාථමික (primary) යතුර වේ.

ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ කවරක් ද?

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ල ම

**24.** ගැලීම් සටහනක් භාවිතයෙන් විස්තර කර ඇති පහත දැක්වෙන ඇල්ගොරිතමය සලකන්න:




ගැලීම් සටහනෙහි ආදාන (inputs) ලෙස X=10 හා Y=20 ලබා දුන්නේ නම්, අනුපිළිවෙළින් X හා Y සඳහා දර්ශනය කරනු (display) ලබන අගයන් මොනවා ද?

(1) 10, 10 (2) 10, 20 (3) 20, 10 (4) 20, 20

**25.** 1 සිට 10 තෙක් වූ සංඛ්‍යාවල (numbers) ගුණිතය (product) ලබා ගැනීම සඳහා Ⓟ ලේබලය ඇතුළත් පහත ව්‍යාජ කේතය (pseudocode) සලකන්න:

```
product = 1
number = 0
repeat
    number = number + 1
    product = product * number
until Ⓟ
```

Ⓟ ලේබලය සඳහා නිවැරදි ප්‍රකාශනය කුමක් ද?

(1) *number* > 10 (2) *number* < 10 (3) *number* >= 10 (4) *number* <= 10


**26.** පෙන්වා ඇති ගැලීම් සටහනෙහි ඇති ඇල්ගොරිතමයේ තර්කනය හා තුල්‍ය වන්නේ කුමන ව්‍යාජ කේත කොටස ද?

(1)
```
N=1
while N<=10
  N=N+1
  display N
end while
```

(2)
```
for N=0 to 10 do
  display N
```

(3)
```
N=0
while N<=10
  display N
  N=N+1
end while
```

(4)
```
for N=1 to 10 do
  display N
```




[පස්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**27** පහත සඳහන් ව්‍යාජ කේතය සලකන්න:

```
X = 0
do
   display ' * '
   X = X + 2
while X < 5
```

ඉහත ව්‍යාජ කේතයේ ප්‍රතිදානය ලෙස ' * ' කොපමණ වාර සංඛ්‍යාවක් දර්ශනය වේ ද?

(1) 2 (2) 4 (3) 5 (4) 6

**28.** පහත සඳහන් ව්‍යාජ කේතය සලකන්න:

```
if average>70 then
   if Sport_colour = 'True' then
      Allrounder_award = 'True'
   end if
end if
```

ඉහත දක්වා ඇති ව්‍යාජ කේතයේ තර්කයට පහත සඳහන් කවරක් තුල්‍ය වේ ද?

(1) average>70 AND Sport_colour = 'True' නම්, එවිට Allrounder_award = 'True' වේ.
(2) average>70 OR Sport_colour = 'True' නම්, එවිට Allrounder_award = 'True' වේ.
(3) average>70 නම්, එවිට Allrounder_award = 'True' වේ.
(4) Sport_colour = 'True' නම්, එවිට Allrounder_award = 'True' වේ.

- අංක **29** සහ **30** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ඡේදය භාවිත කරන්න.

පාසල් පුස්තකාලයෙන් පොත් වෙන් කර ගැනීම (reserve) එහි පරිශීලකයින් විසින් දැනට කරගෙන යනු ලබන්නේ පෝරමයක් සම්පූර්ණ කිරීම මගිනි. පොත ලබා දිය හැකි වූ විට පුස්තකාලය මගින් පරිශීලකයාට ලිපියක් යැවීමෙන් ඒ බව දන්වා සිටිනු ලැබේ. සමහර අවස්ථාවල දී අත්වැරදීමෙන් වැරදි පරිශීලකයකු වෙත මෙවැනි දන්වා යැවීම් සිදු වේ. පුස්තකාලයාධිපති විසින් වත්මන් අත්යුරු පද්ධතිය වෙනුවට නව තොරතුරු පද්ධතියකින් ප්‍රතිස්ථාපනය කිරීමට සැලසුම් කර ඇත. නව පද්ධතියේ දී පරිශීලකයකුට මාර්ගගතව (online) පොතක් වෙන්කර ගත හැකි වේ. වෙන් කරන ලද පොත ලබා දිය හැකි වූ විට, නව පද්ධතිය, ඒ බැව් විද්‍යුත් ලිපියක් මගින් පරිශීලකයා වෙත දන්වනු ලැබේ. පුස්තකාලයාධිපති විසින් අත්යුරු පද්ධතිය හා නව පද්ධතිය යන පද්ධති දෙකම ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත්තේ නව පද්ධතිය ගැටළුවක් නොමැතිව ක්‍රියාත්මක වන බැව් තහවුරු කර ගන්නා තෙක් ය.

**29.** පුස්තකාලයාධිපතිගේ යෝජනාව හා සම්බන්ධ පහත වගන්ති සලකා බලන්න:

A - නව පද්ධතිය මගින් පොත් වෙන් කර ගැනීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වර්ධනය කරයි.
B - නව පද්ධතිය මගින් පොත් වෙන් කර ගැනීමේ ක්‍රියාවලියේ නිරවද්‍යතාව දියුණු කරයි.
C - නව පද්ධතිය මගින් අන්තර්ජාලයට පිවිසිය නොහැකි පරිශීලකයන් වෙත අහිතකර බලපෑමක් ඇති කරයි.

ඉහත වගන්ති අතුරෙන් වලංගු වන්නේ කවරක් ද?

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ල ම

**30.** ඉහත තොරතුරු පද්ධතිය සඳහා යෝජිත ක්‍රියාත්මක කිරීමේ (deployment) ආකාරය කුමක් ද?

(1) සමාන්තර (parallel) (2) කලාගත (phased)
(3) සෘජු (direct) (4) සමාන්තර හා සෘජු යන දෙක ම

**31.** "http://www.doenets.lk/exam/" යන URL එක සලකා බලන්න. මෙහි "doenets.lk" යනු,

(1) වසම් නාමය (domain name) වේ.
(2) අධි පාඨ තැන්මාරු නියමාවලිය (Hypertext Transfer Protocol) වේ.
(3) අදාළ සම්පත් ද්‍රව්‍ය ඇති ස්ථානයේ පථය වේ.
(4) සම්පත් ද්‍රව්‍ය (resource) වේ.

**32.** අදාළ URL එක නොදන්නා විට, වෙබ් අඩවියක ඇති තොරතුරක් සොයා ගැනීමට පහත සඳහන් කුමක් භාවිත කළ හැකි ද?

(1) සෙවුම් යන්ත්‍රය (search engine) (2) ගොනු තැන්මාරු නියමාවලිය (FTP)
(3) විද්‍යුත් තැපැල් සේවාදායකය (email server) (4) වසම් නාම සේවාදායකය (domain name server)

[හයවැනි පිටුව බලන්න.

**33.** අජිත් සහ තවත් තිදෙනකුට යවන ලද විද්‍යුත් තැපැල් ලිපියක පහත පෙන්වා ඇති කොටස සලකා බලන්න:

| | |
|---|---|
| To | ajith@doe.lk |
| Cc | rizvi@nie.lk, kumar@school.net |
| Bcc | frank@nie.lk |
| Subject | Examination Results |

ඉහත පෙන්වා ඇති පරිදි විද්‍යුත් තැපැල් ලිපියක් ඔබ ajith@doe.lk වෙත යැවූයේ නම්, මෙම ලිපිය ලැබී ඇතැයි අජිත්ට දැකගත හැකි වන අයවලුන් වන්නේ කවුරුන් ද?

(1) ajith@doe.lk පමණි
(2) ajith@doe.lk, rizvi@nie.lk සහ kumar@school.net පමණි
(3) ajith@doe.lk, rizvi@nie.lk, kumar@school.net සහ frank@nie.lk පමණි
(4) ajith@doe.lk සහ frank@nie.lk පමණි

**34.** මඳ වේගී අන්තර්ජාල සම්බන්ධතාවයක් හේතුවෙන් පරිශීලකයකුට රූපයක් (image) දැක ගත නොහැකි වන අවස්ථාවක දී ආදේශක තොරතුරක් ලබා දිය හැකි වන්නේ HTML හි ඇති පහත සඳහන් කුමක් භාවිතයෙන් ද?

(1) src (2) href (3) alt (4) img

**35.** http://www.moe.gov.lk වෙත 'Ministry of Education' අධිසන්ධානය (hyperlink) තනාගැනීම සඳහා නිවැරදි HTML කේතය කුමක් ද?

(1) <a>http:// www.moe.gov.lk</a>
(2) <a href="http:// www.moe.gov.lk"> Ministry of Education</a>
(3) <a name="http:// www.moe.gov.lk"> Ministry of Education </a>
(4) <a url="http:// www.moe.gov.lk"> Ministry of Education </a>

**36.** HTML භාවිතයෙන් අංකිත ලැයිස්තුවක් (numbered list) ලබා ගැනීම සඳහා පහත කවර HTML උසුලනය (tag) භාවිත කළ හැකි ද?

(1) <ul> (2) <dl> (3) <ol> (4) <list>

**37.** පහත සිද්ධි සලකා බලන්න:

A - උප්පැන්න සහතිකයක මුල් පිටපතෙහි පිටපතක් මාර්ගගතව (online) ලබා ගැනීම
B - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වෙබ් අඩවිය හරහා ජල බිල්පත් මාර්ගගතව ගෙවීම
C - වාහනයක් සඳහා ආදායම් බලපත්‍රය මාර්ගගතව ලබාගත ගැනීම

ඉහත සඳහන් කවරක් e-රාජ්‍ය සේවා හා සම්බන්ධ වන්නේ ද?

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ල ම

**38.** පහත වගන්ති සලකා බලන්න:

A - නිර්බාධක ජව සැපයුම (UPS)
B - මෘදුකාංග ගිනිපවුර (software firewall)
C - පරිගණකයකට ප්‍රවේශ වීම (login) සඳහා පරිශීලක නාම (user name) හා මුරපද (password) භාවිතය

ඉහත සඳහන් කවරක් තාර්කික ආරක්ෂාව සඳහා නිදසුන් වේ ද?

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ල ම

**39.** පහත සඳහන් කවරක් අන්තර්ජාල භාවිතයේ නිරුපද්‍රිත භාවිත සඳහා උදාහරණ වන්නේ ද?

A - දුරකථන අංක හා ලිපිනය වැනි පෞද්ගලික තොරතුරු සමාජ ජාලවල දී සඟවා තැබීම
B - නොදන්නා පුද්ගලයින්ගෙන් ලැබෙන විද්‍යුත් තැපැල් ලිපිවල ඇති සන්ධාන (links) මත ක්ලික් කිරීම
C - සමාජ ජාලවලදී නාඳුනන අය සමග සන්නිවේදනය කිරීම

(1) A පමණි (2) B පමණි (3) C පමණි (4) A හා C පමණි

**40.** පහත සඳහන් වගන්ති සලකන්න:

A - e-අපද්‍රව්‍ය (electronic waste) අපරීක්ෂාකාරී අයුරින් පරිසරයට බැහැර කිරීම
B - භාවිතයට ගත නොහැකි සංයුක්ත ප්‍රතිදීප්ත පහන් (CFL) සහ අනෙකුත් ඉලෙක්ට්‍රොනික උපකරණ (devices) ප්‍රතිචක්‍රීය මධ්‍යස්ථාන වෙත බාර දීම
C - භාවිත කළ හැකි මට්ටමේ පවතින ඉලෙක්ට්‍රොනික උපකරණ ඉවත නොදමා වෙනත් අයට විකිණීම හෝ පරිත්‍යාග කිරීම

ඉහත සඳහන් ඇ අතුරෙන් ආරක්ෂිත e-අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නිදසුන් වන්නේ

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ල ම ය.

* *

[අන්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

80 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I, II
தகவல் தொடர்பாடல் தொழினுட்பவியல் I, II
Information & Communication Technology I, II

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය II


* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

* **පළමුවන** ප්‍රශ්නයට ලකුණු **20** ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු **10** බැගින් හිමි වේ.

1. (i) (a) $110111001100_2$ යන ද්විමය සංඛ්‍යාව අෂ්ටක සංඛ්‍යාවක් බවට පරිවර්තනය කරන්න. ඔබගේ ගණනය කිරීමේ පියවර ලියා දක්වන්න.

(b) $752_{16}$ ෂඩ්දශමය සංඛ්‍යාව ද්විමය සංඛ්‍යාවක් බවට පරිවර්තනය කරන්න. ඔබගේ ගණනය කිරීමේ පියවර ලියා දක්වන්න.

(ii) චලිත සංවේදකයක් (motion sensor) සහ ආලෝක සංවේදකයක් (light sensor) සහිත දීප්ත පහනක් (flash light) ගොඩනැගිල්ලක ඉදිරි දොරට පිටතින් සවිකර ඇත. අඳුර පවතින අවස්ථා සහ යම් කෙනෙකු පිටතින් දොර වෙත ළඟා වන අවස්ථා දෙක ම සම්පූර්ණ වන විට පහන ස්වයංක්‍රීයව දැල්වේ (ON). කෙනෙකු දොර සමීපයට පැමිණෙන විට චලිත සංවේදකය OFF (0) අවස්ථාවේ සිට ON (1) අවස්ථාවට පත් වේ. ආලෝකය පවතින විට ආලෝක සංවේදකය (light sensor) ON (1) අවස්ථාවට පත්වන අතර අඳුර ඇති විට එය OFF (0) අවස්ථාවට පත්වේ. මෙම සංසිද්ධියට අදාළ පරිපථයේ කැටි සටහනක් (block diagram) පහත *රූපය 1* හි දක්වා ඇත.




*රූපය 1* - තර්කන පරිපථය

(a) ඉහත පරිපථයේ P හා Q සඳහා සුදුසු තාර්කික ද්වාර (logic gates) මොනවා ද?

ඉහත පරිපථයට *රූපය 2* හි දක්වා ඇති පරිදි ස්විචයක් [ON (1) OFF (0)] සහ OR ද්වාරයක් හඳුන්වා දෙනු ලැබේ.




*රූපය 2* - සංශෝධිත තර්කන පරිපථය

(b) *රූපය 2* හි දක්වා ඇති සංශෝධිත තර්කන පරිපථය සලකමින් පහත දී ඇති වගන්ති අතුරෙන් කුමන වගන්ති **දෙක** නිවැරදි දැයි හඳුනාගන්න. අදාළ වගන්ති අංක ලියා දක්වන්න.

① ස්විචය ON (1) සෑම විටම දීප්ත පහන දැල්වේ.

② ස්විචය OFF (0) විට මෙම පරිපථය, *රූපය 1* හි දක්වා ඇති පරිපථයට සමාන ලෙස ක්‍රියාත්මක වේ.

③ පරිපථ දෙකෙහිම හැසිරීම සර්වසම වේ.


(iii) වර්ණ නිරූපණ පද්ධතියක, වර්ණයක් නිරූපණය සඳහා පික්සලයකට බිටු 4 (4 bits per pixel) බැගින් භාවිත කරන්නේ යැයි උපකල්පනය කරන්න. මෙම පද්ධතියට කොපමණ එකිනෙකට වෙනස් වර්ණ සංඛ්‍යාවක් නිරූපණය කළ හැකි ද?

(iv) අභ්‍යාස පොත් තුනක් සහ පෑන් දෙකක් මිලදී ගැනීමට සාමා පොත් සාප්පුවකට යයි. අදාළ අයිතම සොයාගත් පසු ඒවා කවුන්ටරය වෙත ගෙන යයි. අනතුරුව, වෙළෙඳ සහායක විසින් අයිතමවල අලවා ඇති තීරු කේත (barcode) සාප්පුවෙහි ඇති තොරතුරු පද්ධතියට සුපිරික්සනු (scan) ලැබේ. එක් එක් අයිතමයේ ප්‍රමාණ ද පද්ධතියට ඇතුළු කරනු ලැබේ. පද්ධතිය මගින් සෑම අයිතමයකම පිරිවැය සහ සියලු අයිතමවල මුළු පිරිවැය ගණනය කරනු ලැබේ. ඉන්පසු, ගනුදෙනුව සඳහා බිල්පත මුද්‍රණය කරනු ලැබේ.

ඉහත තොරතුරු පද්ධතියේ ආදාන, ක්‍රියාවලි සහ ප්‍රතිදාන සඳහා **එක්** නිදසුන බැගින් ලියා දක්වන්න.

[අටවැනි පිටුව බලන්න.

(v) පරිගණකයක දක්නට ලැබෙන කෙවෙනි (ports) කිහිපයක් පහත Ⓐ - Ⓔ ලේබලවලින් දක්වා ඇත.



Ⓐ Ⓑ Ⓒ Ⓓ Ⓔ

පහත සඳහන් ප්‍රශ්නවල පිළිතුරට අදාළ කෙවෙනියෙහි ලේබලය ලියා දක්වන්න.

(a) ජාල කේබලයක් (UTP) මගින් අන්තර්ජාලයට ප්‍රවේශ වීමට කුමන කෙවෙනිය භාවිත කළ හැකි ද?

(b) අංකිත කැමරාවකින් (digital camera) ගන්නා ලද ඡායාරූප පරිගණකයට කොපි කර ගැනීමට කුමන කෙවෙනිය භාවිත කළ හැකි ද?

(vi) පහත පෙන්වා ඇති ලේඛනය වදන් සැකසුම් මෘදුකාංගයක් උපයෝගී කර ගනිමින් සකස් කර, ලේබල ① සිට ④ තෙක් ලේබල මගින් දක්වා ඇති පරිදි හැඩසවි (format) ගන්වා ඇත. ලේඛනයේ අක්ෂර ප්‍රමාණය (font size) වෙනස් කර නොමැති බව සලකන්න.

| හැඩසවි කිරීමට පෙර | හැඩසවි කිරීමෙන් පසු |
|---|---|
| Covalent Bonds<br><br>Electron sharing between atoms is another method of forming bonds among them. By sharing of electrons like this, the atoms acquire the noble gas configuration. Joining of atoms by sharing electrons between a pair of atoms is referred to as a covalent bond.<br><br>Sharing of electrons between atoms of the same kind gives rise to homoatomic molecules.<br>e.g. hydrogen (H2), fluorine (F2), oxygen (O2), nitrogen (N2) | Covalent Bonds ← ① සහ ②<br><br>Electron sharing between atoms is another method of forming bonds among them. By sharing of electrons like this, the atoms acquire the noble gas configuration. Joining of atoms by <u>sharing electrons between a pair of atoms</u> is referred to as a covalent bond. ← ③<br><br>Sharing of electrons between atoms of the same kind gives rise to homoatomic molecules.<br>e.g. hydrogen ($H_2$), fluorine ($F_2$), oxygen ($O_2$), nitrogen ($N_2$) ← ④ |

*මූලාශ්‍රය: Science text book-grade 10, p174*

වදන් සකසන මෘදුකාංගවල භාවිත වන හැඩසවි මෙවලම් සමහරක් Ⓐ සිට Ⓝ දක්වා වූ ලේබල සහිතව පහත රූපයේ පෙන්වා ඇත.




① සිට ④ ලේබල අංක මගින් පෙන්වා ඇති හැඩසවි ගැන්වීම සඳහා භාවිත කළ හැකි මෙවලම් හඳුනාගෙන එක් එක් අංකයට ගැළපෙන මෙවලම් ලේබල අක්ෂරය ලියා දක්වන්න.

(සටහන : අවශ්‍ය ප්‍රමාණයට වඩා මෙවලම් ලේබල අක්ෂර ලියා ඇත්නම් ලකුණු නොලැබේ.)

(vii) පහත වගන්ති අතුරෙන් කවරක් **සත්‍ය** හෝ **අසත්‍ය** වන්නේ දැයි හඳුනාගන්න. වගන්ති අංකය හා එහි **සත්‍ය** හෝ **අසත්‍ය** බව ලියා දක්වන්න.

① අන්තර්ජාලයට සම්බන්ධ පරිගණකයක් අනන්‍යව හඳුනාගැනීම සඳහා අන්තර්ජාල නාමාවලි ලිපිනය (IP address) භාවිත කරයි.

② දුරස්ථව පවතින පරිගණක අතර ගොනු හුවමාරුව සඳහා ගොනු තැන්මාරු නියමාවලිය (FTP) භාවිත කරයි.

③ HTML ලේඛන හුවමාරු කරගැනීම සඳහා අධි පාඨ තැන්මාරු නියමාවලිය (HTTP) භාවිත කරයි.

④ වලාකුළු (cloud) පරිගණක පරිසරයේ ඇති ගොනු සහ බහළු (files and folders) වෙත අන්තර්ජාල සබඳතාව නොමැතිව පිවිසිය හැකි ය.

(viii) පහත Ⓐ සිට Ⓓ තෙක් වූ ලේබල මගින් ග්‍රාෆික නිර්මාණ (graphic design) මෘදුකාංගයක ඇති නිරූපක (icons) කිහිපයක් පෙන්වයි.



Ⓐ Ⓑ Ⓒ Ⓓ


පහත දක්වා ඇති මෙවලම් නාම ලැයිස්තුවෙන් නිවැරදි මෙවලම් නාමය හඳුනාගෙන ඒවා Ⓐ සිට Ⓓ තෙක් වූ ලේබල ඉදිරියේ ලියා දක්වන්න.

**මෙවලම් නාම ලැයිස්තුව :** [නිම්හම් කිරීමේ (crop) මෙවලම, ලැසෝ (lasso) මෙවලම, අත් (hand) මෙවලම, බුරුසු (brush) මෙවලම, ක්ලෝනීය මුද්‍රා (clone stamp) මෙවලම, මැජික් යෂ්ටි (magic wand) මෙවලම, චලන (move) මෙවලම]

[නවවැනි පිටුව බලන්න.

(ix) පහත රූපයෙන් දක්වා ඇත්තේ පරිශීලකයකු හා පරිගණක පද්ධතියක් අතර අන්තර් ක්‍රියාකාරිත්වයයි. රූපයේ දක්වා ඇති Ⓐ, Ⓑ හා Ⓒ ලේබලවලට ගැළපෙන පද, පහත දී ඇති ලැයිස්තුවෙන් තෝරාගෙන එක් එක් ලේබලයට අදාළ පදය ලියා දක්වන්න.

**ලැයිස්තුව :** [දෘඪාංග (hardware), ව්‍යවහාරික මෘදුකාංග (application software), මෙහෙයුම් පද්ධති මෘදුකාංග (operating system software), ජීවාංග (liveware)]




(x) දාදු කැටයක් දසවරක් උඩ දමා ලැබෙන අගයන්, *A* මගින් දක්වා ඇති අරාවක (Array) ආචයනය (store) කර ඇතැයි උපකල්පනය කරන්න. 5 සංඛ්‍යාව කොපමණ වාරයක් ලැබුණේ දැයි ගණනය කිරීමට Ⓟ, Ⓠ හා Ⓡ ලේබලවලට නියමිත පද දී නොමැති පහත දක්වා ඇති ඇල්ගොරිතමය (algorithm) භාවිත කරනු ලැබේ.

```
count = 0
i = 0
while i < Ⓟ
    if A[Ⓠ] = 5 then
        Ⓡ = count + 1
    end if
    i = i + 1
end while
display count
```

| අරාවක දර්ශකය | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| A | 1 | 3 | 5 | 3 | 2 | 1 | 5 | 4 | 6 | 1 |

ඉහත ඇල්ගොරිතමයේ පෙන්වා ඇති Ⓟ, Ⓠ හා Ⓡ ලේබල සඳහා නිවැරදි පද ලියා දක්වන්න.

**2.** (i) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ආරක්ෂාව පිළිබඳ කාරණා ඇතුළත් පහත දී ඇති ① - ④ වගන්ති සලකා බලන්න:

① අනෙකුත් පරිගණක සඳහා පැතිරවීමට අනිෂ්ට (malware) මෘදුකාංගයක් එය විසින් ම ප්‍රතිවලිත (replicates) වීම

② විද්‍යුත් තැපැල් මෘදුකාංගයක ලැබෙන ලිපි රැඳෙන ස්ථානය (inbox) වෙත, විශේෂ ඉල්ලීමක් නොමැතිව (Unsolicited) විද්‍යුත් තැපැල් ලිපි ලැබීම

③ විශ්වසනීය සන්නිවේදනයක් බව මවාපාමින් යම් අයෙකුගේ බැංකු ගිණුමක පරිශීලක නාමය (username) සහ මුර පදය (password) ලබා ගැනීමට තැත් කිරීම

④ වෙබ් පිටුවක දී අනවශ්‍ය ප්‍රවර්ධක අරමුණු ඇති ඉසිලී එන (pop-ups) නිවේදන විදහා පෙන්වීම

ඉහත දී ඇති ① - ④ දක්වා වගන්තිවලට ගැළපෙන පදය පහත ලැයිස්තුවෙන් තෝරාගෙන අදාළ අංකයට ඉදිරියෙන් ලියා දක්වන්න.

**පද ලැයිස්තුව :** [අනවශ්‍ය ප්‍රචාරක දැන්වීම් (adware), ආයාචිත තැපැල් (spam), තතු බෑම (phishing), වෙබ් රොබෝවරු (bots), පරිගණක වර්ම් (computer worm), ගිනිපවුර (firewall)]

(ii) රූපයේ දක්වා ඇත්තේ පුද්ගලයෙක් තම පරිගණකය භාවිත කරන අයුරු ය. ඔහුගේ ඉරියව්වට (posture) අනුව ඔහුට මුහුණ දීමට සිදු විය හැකි සෞඛ්‍ය සම්බන්ධ ගැටලු **දෙකක්** ලියා දක්වන්න.



(iii) ① - ③ ලේබලවලින් දක්වා ඇති පහත සඳහන් සංසිද්ධි සලකා බලන්න:

① අන්තර්ජාලයෙන් බාගන්නා ලද බලපත්‍ර සහිත මෘදුකාංග යම් පුද්ගලයකු විසින් පිටපත් කර අන් අයට විකිණීම

② සොරකම් කරන ලද පරිශීලක නාමයක් සහ මුරපදයක් භාවිතයෙන් අන්‍යයකුගේ සමාජ ජාල ගිණුමකට ඇතුළු වීම

③ එක් රටක වෙසෙන ගොවි මහතෙකු වෙබ් අඩවිවල ඇති කෘෂිකාර්මික තොරතුරු භාවිත කරන අතර, වෙනත් රටක වෙසෙන ගොවි මහතෙකුට පරිගණක දැනුම හා අන්තර්ජාල ප්‍රවේශය නොමැති වීම නිසා එවැනි තොරතුරු භාවිත කිරීමට නොහැකි වීම

ඉහත ① - ③ දක්වා දී ඇති වගන්තිවලට ගැළපෙන පදය පහත ලැයිස්තුවෙන් තෝරාගෙන අදාළ අංකය ඉදිරියේ ලියා දක්වන්න.

ලැයිස්තුව : [චෞරත්වය (piracy), සයිබර් අපරාධ (cyber crime), අංකිත බෙදුම (digital divide), පෞද්ගලිකත්වය (privacy), විද්‍යුත් ව්‍යාපාර (electronic business)]

[දහවැනි පිටුව බලන්න.

54692


**3.** (i) පහත වම්පස ❶ - ❽ දක්වා ලේබල් මගින් පෙන්වා දෙන උසුලන (tags) සහ පරාමිති (parameter) නොමැති HTML **ගොනුව** සහ දකුණුපස පෙන්වා ඇති එහි **ප්‍රතිදානය** (output) සලකා බලන්න:

HTML ගොනුව

```
<!DOCTYPE html>
<html>
<body>
<h2><❶> Milk Rice </❶></h2>
<❷ src="milkrice.jpg" alt="Milk Rice">
<p align ="❸"> "<❹>Kiribath</❹> is a traditional dish which
    is fit for any auspicious moment. Kiribath also known as
    milk rice is normally served with "lunu miris", a mixture
    of red onions and spices as well as with bananas, jaggery
    & curries. It's a must have for <❺>New Year</❺>
    celebrations & a popular breakfast dish too." </p>
<❻>
<li>3 Cups of Long grain rice (short grain or white rice)</li>
<li>3 Cups of Coconut milk (thick)</li>
<li>4 <❼>1</❼>/<❽>2</❽> Cups of Water</li>
<li> <❼>3</❼>/<❽>4</❽> Teaspoons of Salt </li>
</❻>
</body>
</html>
```

**ප්‍රතිදානය**

## Milk Rice



"*Kiribath* is a traditional dish which is fit for any auspicious moment. Kiribath also known as milk rice is normally served with "lunu miris", a mixture of red onions and spices as well as with bananas, jaggery & curries. It's a must have **New Year** celebrations & a popular breakfast dish too."

- 3 Cups of Long grain rice (short grain or white rice)
- 3 Cups of Coconut milk (thick)
- 4 ½ Cups of Water
- ¾ Teaspoons of Salt

HTML ගොනුවේ ❶ සිට ❽ තෙක් වූ ලේබල අංකවලට අදාළ නිවැරදි උසුලන හෝ පරාමිති පහත ලැයිස්තුවෙන් තෝරාගෙන අදාළ අංකයට ඉදිරියෙන් ලියා දක්වන්න.

**ලැයිස්තුව :** [center, b, br, em, img, justify, i, ol, s, sup, sub, p, tr, td, marquee, u, ul]

(ii) පහත සඳහන් වගන්ති **සත්‍ය** හෝ **අසත්‍ය** දැයි නිර්ණය කරන්න.

① ග්‍රාපික මෘදුකාංගවල ඇති නිම්හම්/පාහිත (crop/trim) මෙවලම භාවිත කර ප්‍රතිබිම්බ (images) දාරවල ඇති අනවශ්‍ය කොටස් ඉවත් කර පික්සල ප්‍රමාණය අඩු කර ගත හැකි වේ.

② රාමුවක ඇති ප්‍රතිබිම්බවල (image) විභේදනය (resolution) අඩු කර සහ රාමුවේ ප්‍රමාණය (frame size) කුඩා කර ගැනීමෙන් වීඩියෝ ගොනුවේ ප්‍රමාණය අඩු කර ගත හැකි වේ.

③ නියැදි ශීඝ්‍රතාව (sampling rate) සම්පීඩනය කළ විට ශබ්ද ගොනුවල ප්‍රමාණය අඩු කර ගත හැකි වේ.

① සිට ③ තෙක් වගන්ති ලේබලය ලියා ඉහත වගන්ති **සත්‍ය** හෝ **අසත්‍ය** දැයි ලියන්න.

**4.** දී ඇති පැතුරුම්පත් කොටසින් දැක්වෙන්නේ 1972 සහ 2014 යන වර්ෂවල දී ආසියානු රටවල් කීපයක $CO_2$ විමෝචනය (kt) පිළිබඳ තොරතුරු වේ.

| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| 1 | **ආසියානු රටවල් කිහිපයක $CO_2$ විමෝචනය (kt)** | | | | |
| 2–3 | රටෙහි නම | 1972 | 2014 | වෙනස | ප්‍රතිශතය |
| 4 | බංග්ලාදේශය | 3509.319 | 73189.653 | | |
| 5 | භූතානය | 3.667 | 1001.091 | | |
| 6 | චීනය | 931575.681 | 10291926.88 | | |
| 7 | ඉන්දියාව | 217849.136 | 2238377.137 | | |
| 8 | ජපානය | 853373.239 | 1214048.358 | | |
| 9 | ශ්‍රී ලංකාව | 3542.322 | 18393.672 | | |
| 10 | මාලදිවයින | 3.667 | 1334.788 | | |
| 11 | $CO_2$ විමෝචනයේ එකතුව (kt) | | | | |

(i) බංග්ලාදේශය සඳහා වූ 2014 සහ 1972 වසරවලදී $CO_2$ විමෝචනයේ වෙනස ගණනය කිරීම සඳහා D4 කෝෂයට ඇතුළත් කළ යුතු සූත්‍රය ලියා දක්වන්න. [වෙනස = 2014 වසරේ අගය – 1972 වසරේ අගය]

[එකොළොස්වැනි පිටුව බලන්න

(ii) බංග්ලාදේශය සඳහා වූ $CO_2$ විමෝචන වැඩිවීමේ ප්‍රතිශතය ගණනය කිරීම සඳහා E4 කෝෂයට ඇතුළත් කළ යුතු සූත්‍රය ලියා දක්වන්න. [වැඩිවීමේ ප්‍රතිශතය = (වෙනස / 1972 හි අගය) × 100]

(iii) D4 හා E4 කෝෂවලට ඇතුළත් කළ සූත්‍ර දෙක, D5:E10 කෝෂ පරාසයට පිටපත් කළේ යැයි උපකල්පනය කරන්න. ශ්‍රී ලංකාවට අදාළව D9 හා E9 කෝෂවල දර්ශනය වන සූත්‍ර **දෙක** පිළිවෙළින් ලියා දක්වන්න.

(iv) දී ඇති සියලු රටවල 1972 හි මුළු $CO_2$ විමෝචනය ගණනය කර පෙන්වීමට =*function1(cell1:cell2)*ආකාරයේ සූත්‍රයක් B11 කෝෂයේ ලියනු ලැබේ. *function1*, *cell1* සහ *cell2* ට අදාළ පද ලියා දක්වන්න.

(v) දී ඇති රටවල 1972 හා 2014 වසරවල $CO_2$ විමෝචනය පෙන්වීම සඳහා පැතුරුම්පත් මෘදුකාංගවල ඇති වඩාත්ම යෝග්‍ය ප්‍රස්තාර වර්ගය නම් කරන්න.

**5.** විදුලි බිල්පත් ගණනය කිරීම සඳහා පහත පෙන්වා ඇති දත්ත සමුදා වගු භාවිත කරනු ලබන්නේ යැයි උපකල්පනය කරන්න. පාරිභෝගිකයෙකුගේ බිල්පත ගණනය කිරීම සඳහා එකම ඒකක මිලක් (rate) භාවිත කරයි.

පාරිභෝගික_දත්ත වගුව

| Name | Acc_No | Type |
|---|---|---|
| A.B. Silva | 1001 | R |
| V. Balasingham | 1002 | C |
| S.S. Gamage | 1003 | R |
| R.T. Alles | 1004 | C |

ගාස්තු වගුව

| Type | Rate |
|---|---|
| R | 10.50 |
| C | 18.50 |

භාවිත වගුව

| Month | Acc_No | Units |
|---|---|---|
| January | 1001 | 185 |
| February | 1001 | 280 |
| January | 1002 | 165 |
| May | 1003 | 270 |

(i) ප්‍රාථමික (primary) යතුරු **දෙකක්** ඒවාට අදාළ වගු සමග ලියා දක්වන්න.

(ii) ආගන්තුක (foreign) යතුරු **දෙකක්** ඒවාට අදාළ වගු සමග ලියා දක්වන්න.

(iii) *පාරිභෝගිකයකුගේ ලිපිනය (customer_address)* යන ක්ෂේත්‍රය ඇතුළත් කිරීමට වඩාත් ම යෝග්‍ය වගුව කුමක් ද?

(iv) අප්‍රේල් (April) මාසය සඳහා *R* වර්ගයට (Type) අයත් *A. B. C. Navaz* නම් වූ නව පාරිභෝගිකයෙක් ඒකක 120ක් භාවිත කර ඇත්නම්, කුමන වගු යාවත්කාලීන කළ යුතු වන්නේ ද?

(v) ඉහත (iv) කොටසෙන් ලැබුණු යාවත්කාලීන කිරීම් සඳහා අදාළ වගුවල යාවත්කාලීන වූ පේළි සහ ඒවාට අදාළ වගු නාම ලියා දක්වන්න. (Acc_No 1005 ලෙස උපකල්පනය කරන්න.)

(vi) ජනවාරි (January) මාසය සඳහා *A. B. Silva* සිල්වාගේ මුළු බිල්පත ලබා ගැනීමට විමසුමක් (query) ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධ කළ යුතු වගු මොනවා ද?

**6.** (i) පුස්තකාල තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීමට අදාළ පහත දක්වා ඇති සංසිද්ධිය සලකා බලන්න:

පුස්තකාල කටයුතු කළමනාකරණය කරගැනීම සඳහා නව තොරතුරු පද්ධතියක් හඳුන්වා දීමට පුස්තකාලයාධිපතිවරයා යෝජනා කළේ ය. **අන්වර්** යෝජිත පද්ධතියේ අවශ්‍යතා හඳුනා ගත්තේ ය. අනතුරුව ඔහු අවශ්‍යතා සපුරාලන පරිදි පද්ධතියක් සැලසුම් කරන ලදී. **අන්වර්**ගේ සැලසුම පාදක කරගනිමින්, **මාලනී** මෘදුකාංග නිපදවූවා ය. **ක්‍රිෂ්ණා** විසින් මෘදුකාංග පරීක්ෂාවක් කරන ලදී. **සමන්** විසින් මෙම පද්ධතිය පුස්තකාලයේ ස්ථාපනය කරන ලදී. මාස කිහිපයකට පසු, **මාලනී** නව පද්ධතියේ ඇති වූ ගැටලු කිහිපයක් නිරාකරණය කරන ලද අතර, අතිරේක වාර්තා දෙකක් මුද්‍රණය කරගැනීම සඳහා මෘදුකාංගයේ වෙනස්කම් ද සිදු කරන ලදී.

(a) පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ ක්‍රියාත්මක කිරීම (implementation) අදියර සඳහා හවුල් වී ඇත්තේ කවුරුන් ද?

(b) සමන් විසින් ඉටුකර ඇත්තේ පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ කුමන අදියර ද?

(c) ක්‍රිෂ්ණා විසින් පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ කුමන අදියර ඉටු කර ඇත් ද?

(d) යෝජිත පද්ධතියේ අවශ්‍යතා වටහා ගැනීම සඳහා අන්වර්ට භාවිත කළ හැකි එකිනෙකට වෙනස් ක්‍රමවේද **දෙකක්** ලියන්න.

(e) පුස්තකාලයේ පවතින පරිගණකවල මෙම නව පද්ධතිය ධාවනය කළ හැකි බව අන්වර් තහවුරු කර ගනියි. මෙහි දී ඇගයීමට ලක් කර ඇත්තේ කුමන ශක්‍යතාවක් ද?

[දොළොස්වැනි පිටුව බලන්න.

(ii) පරිශීලකයකු විසින් 'http://www.nie.lk' වෙබ් පිටුව සඳහා පිවිසීමට යන ක්‍රියාවලියේ පියවර පහත දක්වා ඇත.

A - www.nie.lk යන වසම් නාමය IP ලිපිනයට පරිවර්තනය සඳහා වන ඉල්ලීම වසම් නාම සේවාදායකය (DNS) වෙත යවනු ලැබේ.

B - වසම් නාම සේවාදායකය මගින් 222.165.180.150 යන IP ලිපිනය නැවත එවනු ලැබේ.


C - වෙබ් අතරික්සුව මගින් HTML පිටුව විදැහු (render) කරනු ලබයි.

D - වෙබ් අතරික්සුව මගින් 'http Get' ඉල්ලීම 222.165.180.150 යන IP ලිපිනය ඇති වෙබ් සේවාදායකය වෙත යවනු ලැබේ.


E - 222.165.180.150 යන IP ලිපිනය ඇති වෙබ් සේවාදායකය, HTML දත්ත ප්‍රවාහය (data stream) ආපසු එවනු ලබයි.

F - පරිශීලකයා වෙබ් අතරික්සුව විවෘත කර 'http://www.nie.lk' ඇතුළත් කරයි.

ඉහත පියවරවලට අදාළ ක්‍රියාවලිය පහත රූපයේ දැක්වේ. එම රූපයේ ලේබල අංක ③, ④ හා ⑤ ඉහත B, D හා E නම් පියවර හා පිළිවෙළින් ගළපා ඇත. ඉතිරි පියවර රූපයේ ඇති අංකිත ලේබලවලට නිවැරදිව ගළපා ලේබල අංකය හා පියවර අක්ෂරය ලියා දක්වන්න.





7\. (i) සංඛ්‍යා දෙකක් කියවා කුඩා සංඛ්‍යාව දර්ශනය කිරීම සඳහා වන ඇල්ගොරිතමයක් පහත ගැලීම් සටහනෙහි ඉදිරිපත් කර ඇත.




ගැලීම් සටහනෙහි දක්වා ඇති ඇල්ගොරිතමය සඳහා අදාළ ව්‍යාජ කේතය (pseudocode) ලියා දක්වන්න.

(ii) සංඛ්‍යා තුනක් කියවා අඩුම සංඛ්‍යාව දර්ශනය කර ගැනීම සඳහා අවශ්‍ය ගැලීම් සටහන පහත දැක්වේ. Ⓟ හා Ⓠ සඳහා නිවැරදි පද ලියා දක්වන්න.




* * *


PADANAMA PUBLICATION

# 10 සහ 11 ශ්‍රේණි සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) සාමාන්‍ය පෙළ
## 11 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- [ ] 10-11 සිංහල ව්‍යාකරණ
- [ ] 10-11 සිංහල සාහිත්‍යය රසාස්වාදය
- [ ] බුද්ධ ධර්මය
- [ ] කතෝලික ධර්මය
- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] සිංහල සාහිත්‍යය සංග්‍රහය
- [ ] English Language
- [ ] ගණිතය - 1
- [ ] ගණිතය - 2
- [ ] ජීව විද්‍යාව
- [ ] භෞතික විද්‍යාව
- [ ] රසායන විද්‍යාව
- [ ] ඉතිහාසය
- [ ] ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- [ ] භූගෝල විද්‍යාව
- [ ] පුරවැසි අධ්‍යාපනය
- [ ] පෙරදිග සංගීතය
- [ ] නර්තනය
- [ ] නාට්‍ය හා රංග කලාව
- [ ] චිත්‍ර කලාව
- [ ] තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- [ ] සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- [ ] සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- [ ] කෘෂි හා ආහාර තාක්ෂණය
- [ ] ගෘහ ආර්ථික විද්‍යාව

## 11 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] බුද්ධ ධර්මය
- [ ] ඉතිහාසය
- [ ] ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- [ ] පුරවැසි අධ්‍යාපනය

## Grade 11 - Short Notes

**English Medium**

- [ ] Buddhism
- [ ] Mathematics - 1
- [ ] Mathematics - 2
- [ ] Biology
- [ ] Physics
- [ ] Chemistry
- [ ] History
- [ ] Business & Accounting Studies
- [ ] Geography
- [ ] Civic Education
- [ ] ICT
- [ ] Health & Physical Education
- [ ] 10-11 English Literary (Poetry)
- [ ] 10-11 English Literary (Drama)
- [ ] 10-11 English Literary (Short Story)

## Grade 11 - Model Papers

**English Medium**

- [ ] Civic Education

## 10 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- [ ] බුද්ධ ධර්මය
- [ ] කතෝලික ධර්මය
- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] සිංහල සාහිත්‍යය සංග්‍රහය
- [ ] සිංහල රචනා අත්වැල
- [ ] English Language
- [ ] ගණිතය - 1
- [ ] ගණිතය - 2
- [ ] ජීව විද්‍යාව
- [ ] භෞතික විද්‍යාව
- [ ] රසායන විද්‍යාව

- ඉතිහාසය
- ඉතිහාසය රූප සටහන් අශ්‍රිත කෙටි සටහන්
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 1
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 2
- භූගෝල විද්‍යාව
- පුරවැසි අධ්‍යාපනය
- පෙරදිග සංගීතය
- නර්තනය
- නාට්‍ය හා රංග කලාව
- චිත්‍ර කලාව
- තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- කෘෂි හා ආහාර තාක්ෂණය
- ගෘහ ආර්ථික විද්‍යාව
- ජපන් භාෂාව

## 10 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- සිංහල භාෂාව හා සාහිත්‍යය
- බුද්ධ ධර්මය
- ගණිතය
- විද්‍යාව
- ඉතිහාසය
- පුරවැසි අධ්‍යාපනය
- භූගෝල විද්‍යාව
- පෙරදිග සංගීතය

## පාඩමෙන් පාඩමට මාසික ඇගයීම්

**සිංහල මාධ්‍ය**

- 10-ශ්‍රේණිය - විද්‍යාව
- 11-ශ්‍රේණිය - විද්‍යාව

## Grade 10 - Short Notes

**English Medium**

- Buddhism
- Mathematics - 1
- Mathematics - 2
- Biology
- Physics
- Chemistry
- History
- Business & Accounting Studies - 1
- Business & Accounting Studies - 2
- Geography
- Civic Education
- ICT
- Health & Physical Education

## Grade 10 - Model Papers

**English Medium**

- Mathematics
- Science
- Civic Education
- Geography
- English Activity Book
- English Work Book

## අනෙකුත් ග්‍රන්ථ

- හෙළදිව කතිකාවත
  - අරුණශාන්ත අමරසිංහ
- හොල්මන් අවතාර සහ යකදුරන්
  - අරුණශාන්ත අමරසිංහ
- සිසු-ගුරු අත්පොත නාට්‍ය හා රංග කලාව 10-11 ශ්‍රේණි සඳහා (නව විෂය නිර්දේශය) - නන්දන අල්ගේවත්ත

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන්, ප්‍රශ්න පත්‍ර කට්ටල සහ වැඩ පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.